# ඉතිහාසයෙන් සැඟවුණ විලඳගොඩ පුරාවිද්‍යා පරිශ්‍රය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ජේ.එච්.එම්.එන්.එම්.ප්‍රේමරත්න[1],කේ.ජී.එස්.එස්.කේ. ගුණරත්න[2]

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[1]madupremarathna94@gmail.com, [2]sandyagunarathna06@gmail.com

ප්‍රමුඛ පදඃවිලඳගොඩ, ශිලාලේඛන, පුරාවස්තු

## හැඳින්වීම

වයඹ පළාතේ පුරාවිද්‍යා ස්මාරක හා පුරාවස්තු රැසක් ස්ථානගත වී ඇති පරිශ්‍රයක් ලෙස විලඳගොඩ හඳුන්වාදිය හැකිය. එහෙත් පුරාවිද්‍යාත්මක වශයෙන් වටිනාකම් රැසක් පැවතිය ද මෙම ස්ථානය සම්බන්ධයෙන් ඇති ලිඛිත සාධක නොමැති තරම් ය. එහෙත් එහි පවතින පුරාවිද්‍යාත්මක සාධක පදනම් කරගෙන ඓතිහාසික තොරතුරු අනාවරණය කර ගත හැකිය.

පුත්තලම් දිස්ත්‍රික්කයේ රාජාවන්නි පත්තුවේ පහළ පුලියන්කුලම ග්‍රාම නිලධාරි වසමේ විල්පත්තු අභය භූමියට මායිම්ව මෙම පුරාවිද්‍යා ස්ථානය පිහිටා ඇත. අනුරාධපුර පුත්තලම් මාර්ගයේ 17 වැනි සැතපුම් කණුවේ සිට කි.මී. 13ක් පමණ දුෂ්කර ගමන්නාන්තයකින් පසු මෙම ස්ථානට ළඟා විය හැකිය. අක්කර 500ක් පමණ විශාල භූමි ප්‍රදේශයක් පුරා පැතිරි ඇති මෙම ස්ථානය අතීතයේ භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් වැඩ වාසය කළ ලෙන් ආරාම සංකීර්ණයක් ලෙස සැළකීමට හැකිය. සාමාන්‍ය ව්‍යවහාරයේ දී මෙම ස්ථානය විලඳගොඩ ලෙසින් හඳුන්වන අතර පරණවිතානගේ ශිලාලේඛන සංග්‍රහයේ එය හඳුන්වා ඇත්තේ "විරන්දගොඩ" වශයෙනි. එහෙත් මෙම ස්ථානයෙන් හමුවී ඇති ටැම් ලිපියක මෙම ස්ථානය " නදුන්නරු නගරයේ සාලවන විහාරය" වශයෙන්ද හඳුන්වා ඇත. ඒ අනුව මෙම ලිපිය තුළ මෙම ස්ථානය විලඳගොඩ පුරාවිද්‍යා ස්ථානය ලෙස හඳුන්වා ඇත.

විලඳගොඩ පුරාවිද්‍යා ස්ථානය ආශ්‍රිත විමර්ශනයේ දී ප්‍රධාන වශයෙන් ශිලාලේඛන, කටාර සහිත හා රහිත ලෙන් ආරාමයන්, වැව් හා පොකුණු රැසකින් සමන්විත දියුණු ජල කළමනාකරණ පද්ධතියක් සහිත ඓතිහාසික ස්ථානයක් බව කිව හැකි ය. කෙසේ නමුත් පුරාවිද්‍යා උරුමය තුළ විලඳගොඩ පුරාවිද්‍යා පරිශ්‍රයට හිමි වටිනාකම කෙබඳුද යන්න මෙහිදී මූලික ගැටලුව ලෙස තෝරා ගත් අතර අදාළ පරිශ්‍රය තුළ පවතින පුරාවිද්‍යාත්මක සාධක මත ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක තොරතුරු අධ්‍යයනය කිරිමේ අරමුණින් මෙම පර්යේෂණය සිදු කෙරිණි.

## ක්‍රමවේදය

දත්ත එක්රැස් කිරිමේ දී ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර නොවන ගවේෂණය, ක්ෂේත්‍ර ගවේෂණය හා සම්මුඛ සාකච්ඡා ආදී ක්‍රමවේදයන් අනුගමනය කිරිමට සිදු විය. මෙම පුරාවිද්‍යා ස්ථානය සම්බන්ධයෙන් බොහෝ ලේඛනගත තොරතුරු වාර්තා නොවීම එයට හේතුවයි. එහෙත් ප්‍රාථමික මූලාශ්‍රය ලෙස මහාවංසය වැනි ග්‍රන්ථයන් පරිශීලනය කළ අතර පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව විසින් පිටපත් කරන ලද ශිලාලේඛන සංග්‍රහයද අධ්‍යයනය කරන ලදි. රැස් කර ගත් දත්ත විශ්ලේෂණය කිරිමේ දී පර්යේෂණ සීමාව

ලෙස විලඳගොඩ පුරාවිද්‍යා පරිශ්‍රය තෝරා ගන්නා ලදි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

උක්ත ක්‍රමවේදයන්ට අනුව රැස් කරගත් දත්ත විශ්ලේෂණය කිරිමේ දී ඉතිහාසය තුළ සැළකිය යුතු වකවානුවක් තුළ නිර්මාණය වු පුරාවිද්‍යාත්මක වටිනාකම් රැසක් සහිත ස්ථානයක් ලෙස විලඳගොඩ පුරාවිද්‍යා පරිශ්‍රය හඳුන්වාදිය හැකිය. කෙසේ නමුත් මෙහි නිර්මාණය වන කාලය හා නිර්මාණකරුවන් පිළිබඳ සඳහන් කිරිමේ දී නිශ්චිත එක් අදහසක් ඉදිරිපත් කළ නොහැකි අතර ඒ සඳහා පුරාවිද්‍යා සාධක මත පදනම්ව නිගමනයන්ට එළඹීම වඩාත් සුදුසුය. මෙම ස්ථානය පිළිබඳ අධ්‍යයනය කිරිමේ දී පුරාවිද්‍යාත්මක මෙන්ම ජනප්‍රවාද සාධක පිළිබඳවද අවධානය යොමු කළ යුතුය. ඒ අනුව සාලිය අශෝකමාලා එක්ව වාසය කළ ස්ථානය ලෙස ජනප්‍රවාදවල මෙම ස්ථානය සළකනු ලැබේ. මුල් කාලයේ මෙම ස්ථානය සාලිය ගුහාව ලෙස හදුන්වා ඇතත් වර්තමානයේ එය සාලිය විහාරය ලෙස හඳුන්වනු ලැබේ.

ජනප්‍රවාදවලට අනුව "දුටුගැමුණු රජු විසින් සාලිය කුමරු හමුවීමට මෙම ස්ථානයට ගොස් ඇති අතර එහි දී කුමරු විසින් විලද හා මී පැණි මිශ්‍ර ආහාරයක් රජුට පිළිගන්වා ඇත. එහි දී රජු කුමරුට රජකමද හැර සැඩොල් කුමරියක් සමග පැනයාමට දඬුවමක් ලෙස විලඳ ඇට තරමට වෙහෙර විහාර තනන ලෙස සඳහන් කර ඇත. ඒ අනුව මෙම ස්ථානය විලඳගොඩ ලෙස හඳුන්වා තිබේ. අද වන විටත් මේ ස්ථානයට ආසන්න ප්‍රදේශ " සාලියගම, සාලිය වැව" යන නම්වලින් හැදින්වීමෙන් මේ පුවත පිළිබද යම් ඉඟියක් සපයා ගත හැකිය. ජනප්‍රවාදවලට අනුව මෙම ස්ථානය සාලිය කුමරු විසින් නිර්මාණය කරන ලද බවට ද, එහෙත් මහාවංසයට අනුව ධාතුසේන රජු විසින් නිර්මාණය කරන ලදැයි සැළකෙන අටලොස් විහාර අතරින් එකක් විය හැකි බවද පෙන්වාදිය හැකිය. එහෙත් පළමුවැනි මහින්ද රජු සමයේ දී මෙන්ම දප්පුල රජුගේ කාලයේදීද සාලවන නම් විහාරයක් පිළිබද තොරතුරු සඳහන් වේ. එහෙත් මෙහි ඇති ශිලා ලේඛන සාධක පරික්ෂා කර බැලීමේ දී ක්‍රි. පු. 3-1 එනම් අනුරාධපුර මුල් අවධියට අයත් වන බව පැහැදිළි වේ. එම ශිලාලේඛනවල සඳහන් ප්‍රදානයන් දෙස බැලීමේ දී අතීතයේ පරුමකවරු, උපාසිකාවන් ආදින් විසින් මෙම ලෙන් ආරාම භික්ෂුන් උදෙසා පුජා කරන ලද බව ද පැහැදිලි වේ. ඒ බව මේ ස්ථානයේ දක්නට ලැබෙන ශිලා ලේඛන තුළින් පෙනේ. එල්ලාවල මේධානන්ද හිමියන්ගේ උතුරු නැගෙනහිර බෞද්ධ උරුමය නම් ග්‍රන්ථයට අනුව සාලිය විහාරයේ පිහිටි අටස් කණුවේ "නදුන්නරු නගරයේ පිහිටි නදුන්නරු විහාරයට යම් යම් රාජ්‍ය නිලධාරින්ගෙන් වාදවිවාද අවුල් වියවුල් නොකළ යුතු බවට රාජ්‍ය ආඥාවක් නිකුත් කර ඇත". ඒ අනුව මෙම ස්ථානය නන්දන හෝ නදුන්නරු නගරය ලෙස හදුන්වා ඇත. මෙම ස්ථානයේ පිහිටිම දෙස බැලිමේදීද දුටුගැමුණු හෝ වෙනත් රජ කෙනෙක් මෙම ස්ථානය ආරක්ෂිත බලකොටුවක් ලෙස භාවිතා කරන්නට ඇති බවද උපකල්පනය කළ හැකිය. මෙම ස්ථානයේ බැලුමක හැඩයේ ගල පිහිටා ඇති අතර එය බැලුම් ගලක් ලෙස ප්‍රදේශය නිරික්ෂණය කිරිම සඳහා භාවිත කළේද නැත්නම් එය ගල් උගුලක් ලෙස සතුරා දෙසට යොමු කිරීමට භාවිතා කළේ ද යන්න නිශ්චිත නොවේ.

මෙම ස්ථානයේ ඇති පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳ සඳහන් කිරිමේ දී සෙල්ලිපිවලට ප්‍රධාන ස්ථානයක් හිමිවේ. ඒ අනුව මෙහි ශිලා ලේඛන 11ක් පමණ දැනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අනාවරණය කර ඇත. ඒ අනුව ලෙන් ලිපි, ටැම් ලිපි, පර්වත ලිපි මෙන්ම ප්‍රධාන ලෙන් සංකීර්ණයේ නැගෙනහිර ගල්

තලාවේ වහරල ලිපි කිහිපයක්ද දක්නට ලැබේ.

එමෙන්ම මෙම ස්ථානයේ ලෙන් 66ක් ද ඒ අතරින් කටාර කොටන ලද ලෙන් 32ක්ද දක්නට ලැබේ.එමෙන්ම වැව් 11ක්ද සාලිය පොකුණ හා ගිනිහල් පොකුණ ආදි පොකුණු කිහිපයක්ද තිබීමෙන් භික්ෂුන්ගේ ජල අවශ්‍යතාවයන් සඳහා විධිමත් ජල කළමනාකරණ පද්ධතියක් පවතින්නට ඇති බව ද පෙනේ. මෙහි හුදකලා ගල්තලාව මත ඇති බෑලුම් ගලෙහි වටේටම කටාර කොටා ඇති අතර එහි යටි පැත්තේ සිතුවම් පැවති බවට සැක කළ හැකි බදාම තට්ටුවක් වේ. එහි චිත්‍ර පැවතියේ නම් කටාර මඟින් ජලය ගලා යාම වැළකුණද එය හුදකලා ගල් තලාවක් මත පිහිටීම නිසා විනාශ වන්නට ඇති බව උපකල්පනය කළහැකිය. ඊට අමතරව ස්තූප කිහිපයක්ම දක්නට ලැබෙන අතර අද වන විට නිධන් හොරුන් විසින් ඒවා විනාශ කර ගඩොල් පමණක් තැන තැන විසිරී ඇත. සිරිපතුල් ගල්, මල් ආසන, අලංකාර ගල් උළුවහු ආදිය මෙහි ඇති කලාත්මක අංග ලෙස සදහන් කළ හැකිය. ඒ අනුව මෙම ස්ථානය මුල් කාලයේ රජුන් ආරක්ෂිත නගරයක් හෝ ආරක්ෂිත ස්ථානයක් ලෙස ද භාවිතා කරන්නට ඇති නමුත් පසු කාලයේ මෙම ස්ථානය ආරාමික භාවනායෝගි භික්ෂුන්ගේ වාසය කළ ලෙන් ආරාම සංකීර්ණයක් බවට පත් වන්නට ඇත.

ඒ අනුව විලඳගොඩ පුරාවිද්‍යා ස්ථානය දෙස බැලීමේ දී ප්‍රධාන වශයෙන් ශිලාලේඛන, කටාර සහිත හා රහිත ලෙන් ආරාම සංකීර්ණයක් ලෙස ද, වැව් හා පොකුණු රැසකින් සමන්විත දියුණු ජල කළමනාකරණ පද්ධතියක් පැවති බවටද, සිරිපතුල් ගල්, මල් ආසන හා කැටයම් සහිත ගල් උළුවහුවලින් සමන්විත ධිවිමත් සැලසුමක් සහිතව නිර්මාණය වන්නට ඇති බව පෙනේ. එහෙත් තවමත් පැහැදිළි ලෙස ආවරණය වූ ඉතිහාසයට වඩා අනාවරණය නොවූ ඓතිහාසික සිදුවීම් රැසකට සාක්ෂි දරණ ඓතිහාසික පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත්කම් රැසක් සහිත ස්ථානයක් ලෙස විලඳගොඩ පෙන්වාදිය හැකි ය.

### ආශ්‍රිත ග්‍රන්ථ


වික්‍රමසිංහ, ඩී.එම්. (2000)***ශිලා ලේඛන සංග්‍රහය.*** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

සුමංගල ශ්‍රී., දේවරක්ඛිත, බටුවන්තුඩාවේ. (1996)***මහාවංසය.***කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.


### සම්මුඛ සාකච්ඡා


ජයතිලක, උපුල්. (30.01.2018. පෙ.ව.10.30 සිට ප.ව.2.00 දක්වා)පුත්තලම පුරාවිද්‍යා උප කාර්යාලය.